ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 29/03/2021.

පැමිණිලි පාර්ශවය : කේ.කේ.ඩබ්. ලාල් විමලසිරි මයා.
54, රාජසූරිය මාවත,
පොල්වත්ත,
අම්බලන්ගොඩ.

වගඋත්තර පාර්ශවය : 01. උ.පො.ප. - ඩී.ඩබ්.සිරිමාන්න මයා.
ස්ථානාධිපති, අපරාධ අංශය,
පොලිස් ස්ථානය,
අම්බලන්ගොඩ.

02. මූ.පො.ප. මහින්ද විල්ලෝවආරච්චි මයා.
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
අම්බලන්ගොඩ.

<u>පැමිණිලි අංකය : HRC/1321/15</u>

**පැමිණිලි පාර්ශවයේ කරුණු ඉදිරිපත් කිරීම :-**

ඉහත නම් සඳහන් පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2015.03.22 දින අම්බලන්ගොඩ ධර්මාශෝක හා දේවානන්ද විද්‍යාල අතර පැවති ක්‍රිකට් තරගය නිම වී නිවසට යන අතරතුරදී පාර්ශව දෙකක් අතර ගැටුමක් ඇති වූ බවයි. මෙම ගැටුමට වින්දිත පාර්ශවය වන ළහිරු චතුරංග හා ආර්.ජ්. සනත් යන අයද සම්බන්ධ වූ බවත් පසුව ගැටුම සමථයකට පත් කිරීම සඳහා අනෙක් පාර්ශවයේ නිවසට පැමිණෙන ලෙසට ආරාධනාවක් ලැබූ බවත්, ඒ අනුව එම නිවසට ගිය පසු නැවත ගැටුමක් ඇති වූ බවත්, එහිදී වින්දිතයාගේ හිසෙහි පිටුපසට, තළලට තුවාල සිදුවී ලේ ගැලූ බවත්

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி } 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ලේකම් / செயலாளர் } 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ක්ෂණික ... } 1996
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
වෙබ් }

කඩු මිටකින් පහරදුන් බවත් සඳහන් කර ඇත. පසුව ඉන් මිදී ප්‍රතිකාර ගැනීම සඳහා රෝහල වෙත ගියද එම රෝහලේ ගැටුමට සම්බන්ධ අනෙක් පාර්ශය සිටි බැවින් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පුද්ගලික රෝහලක් වෙත යාමේදී අම්බලන්ගොඩ පොලිස් ස්ථානය ඉදිරිපිටදී පොලිස් නිලධාරීන් විසින් රථය නැවැත්වූ බව සඳහන් කර ඇත. එහිදී තමන් ඇතුළු තිදෙනා අත්අඩංගුවට ගත් බවත් ඒ වනවිට වේලාව පැය 19.00 ට පමණ වූ බවත්, තුවාල ලබා ලේ ගලමින් සිටි වින්දිතයන් පැය 3ක් පමණ තබා සිටි බවත් ප්‍රතිකාර ලබාදීමක් සිදු නොවුනා මෙන්ම පහරදීමක්ද සිදු කළ බවත්, ස්ථානාධිපති ඇතුළු වගඋත්තරකරුවන් ඒකපාර්ශවිකව කටයුතු කළ බවත් ඒ තුළින් අසාධාරණයක් සිදුවූ බවත් ප්‍රකාශ කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම =:**

2015.09.01 දාතමින් වාර්තාවක් ඉදිරිපත් කරමින් වගඋත්තරකරුවන් සඳහන් කර ඇත්තේ, 2015.03.22 වන දින තො : 21 මහ අම්බලන්ගොඩ, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි සචිනි සංදීපනී ලොකුගමගේවා හා ලෂිනි මෙහෙරා ලොකුගමගේවා යන අය පදිංචි ඉහත ලිපිනයට ලහිරු චතුරංග සනත් රත්නායක යන දෙදෙනා ඇතුළු තමන් කණ්ඩායමක් අයුතු ලෙස ඇතුල් වී අයුතු ජනරාශියක සාමාජිකයින් වී කඩු, පොලු, කැති, බෝම්බ පිස්තෝල පෙන්වා බිය ගන්වා වෙඩි තැබීමක් කළ බවට කරනු ලැබූ දැනුම්දීමක් මත විමර්ශනයක් සිදු කළ බවයි.

සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණයේදී කාර් රථයකින් හා යතුරුපැදිවලින් පැමිණි සැකකරුවන් එම ස්ථානයේ වෙඩි තැබීමක් සිදුකළ බවට කරුණු අනාවරණය කරගත් බවත්, ඒ අනුව අවිආයුධ සමග පලාගොස් සිටි සැකකරුවන් පොලිස් ස්ථානය ඉදිරිපිටදී කාර් රථය නවත්වා පරීක්ෂා කළ බව සඳහන් කර ඇත. එහිදී ලේ ගලන තුවාල සහිතව ලහිරු චතුරංග හා සනත් රත්නායක සිටි බවත් පසුව 20.50 ට අත්අඩංගුවට ගත් බවත් ඔවුන්ගේ සන්තකයේ තිබී ජීව අත්බෝම්බයක් ද රථයේ තිබී සොයා ගත් බවත් කියා සිට ඇත. අත්අඩංගුවට ගනු ලැබූ සැකකරුවන් 2015.03.23 වන දින අංක 79120 යටතේ බලපිටිය මහේස්ත්‍රාත් වෙත ඉදිරිපත් කළ බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**විමර්ශනයේදී අනාවරණය වූ කරුණු =:**

2015.03.22 වන දින අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලය හා දේවානන්ද විද්‍යාලය අතර ක්‍රිකට් තරගයක් පවත්වා ඇති අතර, මෙම ක්‍රිකට් තරගය නැරඹීම සඳහා වින්දිත තැනැත්තා වන ලහිරු චතුරංග හා ඔහුගේ මිතුරන් සමග ක්‍රිකට් තරගය නැරඹීමට ගොස් ඇත. එහිදී මිතුරන් අතර යම් ගැටුමක් නිර්මාණය වී තිබෙන බවට ඉදිරිපත් කර තිබෙන දිවුරුම් ප්‍රකාශවලින් සනාථ වේ.

පසුව ළහිරු චතුරංග හා ඔහුගේ මිතුරන් තිදෙනෙකු සත්සර යන අයගේ නිවස අසළට ගොස් ඇති අතර එහිදී නැවතත් ගැටුමක් හටගෙන ඇති බවත්. එහිදී ළහිරු චතුරංග යන අයගේ ඔළුවට පහරක් වැදී ඔළුව තුවාල වී ඇති බවත් අනාවරණය වේ. ඊට අදාළ ඡායාරූප කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වුවත් මෙම පිරිස එතනින් තික්ම ප්‍රතිකාර ගැනීම සඳහා ගිය බවක් ඔවුන්ගේ දිවුරුම් ප්‍රකාශවලින් ප්‍රකාශ වේ. ප්‍රතිකාර ලබාගැනීමට යන අවස්ථාවේදී ඔවුන් සමග දෙවන වින්දිතයා වන සනත් යන අයද පිටත් වී ඇත. ඔවුන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානය ඉදිරිපිටින් යන අවස්ථාවේදී රථ වාහන රාජකාරියේ නිරතව සිටි නිලධාරීන් විසින් මෙම රථය නවත්වා ඇති අතර. ඒ වනවිට ගැටුම සම්බන්ධ තොරතුරු පොලිසිය වෙත ලැබී තිබී ඇත. අත්අඩංගුවට ගැනීම සම්බන්ධව දෙවන වගඋත්තරකරු සටහන් යොදා ඇත්තේ පැය 21.45ට වේ. ඒ සැකකරුවන් අත්අඩංගුවට ගෙන ස්ථානාධිපතිට ඉදිරිපත් කර අදාල සිද්ධිය විභාග කිරීමෙන් අනතුරුවයි. වගඋත්තර පාර්ශවයට අනුව අත්අඩංගුවට ගැනීම සිදු වන්නේ 20.50 ට වන අතර. පැමිණිල්ල ප්‍රකාශ කරන පරිදි මෙම සැකකරුවන් අත්අඩංගුවට පත්වන්නේ පැය 19.00 ට පමණ වේ. එලෙස අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ළහිරු චතුරංග ලේ ගලන තුවාල සහිතව සිටි බවට කරුණු තහවුරු වී ඇත. පැමිණිල්ල විභාග කරන අවස්ථාවේ වින්දිතයන් හට පහරදීමක් සිදු කළ බවට දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. තුවාල වීම සම්බන්ධව අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත ලැබී තිබෙන අතර එහි ගැටුම හා ඉන් ලද තුවාල සම්බන්ධව සඳහන් වී ඇත.

පොලිස් නිලධාරීන් විසින් පහරදීමක් කළ බව රෝගියා පරීක්ෂා කරන අවස්ථාවේ වෛද්‍යවරයා වෙත සඳහන් වී නොමැති බව අධිකරණ වෛද්‍ය වාර්තාව නිරීක්ෂණය කිරීමේදී ගම්‍ය වේ.

තවද මෙම සැකකරුවන් 2015.03.24 දින බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර. එහිදී ජීව අත්බෝම්බයක් සන්තකයේ තබා ගැනීමේ චෝදනාව දක්වා ඇත. පැමිණිලි පාර්ශවය දකුණු පළාත් මහාධිකරණය වෙත ඇප අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු 2015.06.09 දින සැකකරුවන්ට ඇප ලැබී ඇති අතර. එම ඇප නියෝගයේ මහාධිකරණ විනිසුරු එම්.අයි. සෙනෙවිරත්න මහතා විසින් කර තිබෙන ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කිරීමේදී එහි සඳහන් වන්නේ.

*"අත්බෝම්බය සොයාගත් බවට බී වාර්තාව මගින් අධිකරණයට කරුණු වාර්තා කර ඇත. මේ අවස්ථාව වනවිට රථයේ පුද්ගලයින් දෙදෙනෙකු ගමන් කළ බව අනාවරණය වී ඇත. එනම් මෙම සැකකරුවන් දෙදෙනාය. එහෙත් සොයා ගන්නා යැයි කියනු ලබන බෝම්බය බෑගයක් තුළ ආවරණය කර තිබුනු බව පෙනී යයි. එවිට එය ප්‍රදර්ශනය නොවන්නකි.*

එබැවින් පුද්ගලයින් දෙදෙනා අතරින් කුමන පුද්ගලයා මෙම බෝම්බය රැගෙන ආවාද යන්න පිළිබඳ ගැටලුවක් ඇත. එය අනාවරණය වී තිබුනා නම් දෙදෙනාටම අනන්‍ය සන්තකය පිළිබඳ වගකීම් පැවරිය හැකිය. එහෙත් රථයේ ගමන් කරන ලද පුද්ගලයින් දෙදෙනා අතරින් කුමන සැකකරුට මේ පිළිබඳ දැනීමක් තිබුණාද යන්න මේ අවස්ථාවේදී සැක සහිතය. එවිට අනන්‍ය සන්තකයක් පිළිබඳ වගකීම සැකකරුවන් දෙදෙනාටම අරෝපණය කළ නොහැකිය.

02 වන කරුණ වන්නේ, වාහනය තුළ තිබී අත්අඩංගුවට ගත්තා යැයි කියනු ලබන මෙම පිඩාකාරී ආයුධය අත්අඩංගුවට ගැනීමෙන් පසුව මුද්‍රා තැබූ බවක් බී වාර්තාවේ සඳහන් නොකිරීමය.

අද දින මෙම අධිකරණයට කැඳවන ලද විමර්ශන සටහන් වලද එම අත්අඩංගුවට ගත්තා යැයි කියනු ලබන බෝම්බය මුද්‍රා තැබීමක් කළ බවට අනාවරණය නොවේ.

එය සුවිශේෂී කරුණක් ලෙස මා සලකනු ලබන්නේ පීඩාකාරී ආයුධයක් සන්තකයේ තබා ගත්තා යැයි කියන චෝදනාවක් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට නම් පැමිණිල්ල විසින් සාධනය කළ යුතු එක් අංගයක් වන්නේ එලෙස අත්අඩංගුවට ගත්තා යැයි කියන පීඩාකාරී ආයුධය අත්අඩංගුවට ගත් අවස්ථාවේ සිට විශ්ලේෂණය සඳහා රජයේ රස පරීක්ෂක කාර්යාලය වෙත ඉදිරිපත් කරන තෙක් එලෙස අත්අඩංගුවට ගත් නඩු භාණ්ඩය ආරක්ෂිතව සහ සුරක්ෂිතව තැබූ බව සාධනය කිරීම පැමිණිල්ලේ යුතුකම වන හෙයිනි.

එවැනි භාණ්ඩයක් ආරක්ෂිතව සහ සුරක්ෂිතව රජයේ රස පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරන තෙක් තැබිය හැකි ප්‍රථම පියවර වන්නේ එය මුද්‍රා තැබීමයි. එලෙස මුද්‍රා තැබීමක් නොකළෙහි නම් එහි ආරක්ෂිතභාවය සහ සුරක්ෂිතභාවය පිළිබඳ සාධනය කිරීම අපොහොසත් වනු ඇත.

මෙවැනි පීඩාකාරී ආයුධයක් හෝ තහනම් ගිනි අවියක් හෝ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගනු ලබන පොලිස් නිලධාරිවරයෙකුගේ මූලික වගකීමක් විය යුතු වන්නේ එය විශ්ලේෂණය කිරීම සඳහා රජයේ රස පරීක්ෂක කාර්යාලය වෙත ඉදිරිපත් කරන තෙක් එම නඩු භාණ්ඩය ආරක්ෂිතව සහ සුරක්ෂිතව තැබීමය.

මෙම නඩුවෙහි සොයා ගත්තා යැයි කියනු ලබන අදාළ අත්බෝම්බය සම්බන්ධයෙන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති වන උ.පො.ප. සිරිමාන්න විසින් එම ආරක්ෂිත පිළිවෙළ අනුගමනය කර නොමැත. එය යම් දිනයකදී මෙම සැකකරුවන්ට එරෙහිව ගරු නීතිපතිවරයා විසින් අධිචෝදනා පත්‍රයක් ගොනු කර නඩු විභාගයක් පැවැත්වීමට

*සුදානම් වනවිට බරපතල ගැටලුකාරී තත්වයකට මුහුණ දීමට සිදුවන බව මා නිරීක්ෂණය කරමි." යනුවෙනි.*

තවද මෙම ළහිරු චතුරංග යන අය අත්අඩංගුවට පත්වන්නේ පැය 19.00 පමණ වන අතර, උපසේවයට භාරදී ප්‍රතිකාර සඳහා යොමු කර ඇත්තේ පැය 22.25 ට පමණ බව පොලිස් ස්ථානයේ ලේඛන පරීක්ෂාවේදී තහවුරු වේ. තවද මෙම තුවාලකරු (සැකකරු) සිර මැදිරියේ තැබූ බවටද කරුණු අනාවරණය වේ. ඒ අනුව ප්‍රතිකාර ලැබිය යුත්තෙකු නිසි ප්‍රතිකාර සඳහා යොමු කිරීම ප්‍රමාද කළ බවට ඒ අනුව ගම්‍ය වේ. පහරදීමක් පිළිබඳව කරුණු අනාවරණය නොවූනද සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීම්දී නිසි ක්‍රියාපටිපාටියක් අනුගමනය නොකිරීම මෙන්ම තුවාලකරු සිර මැදිරියට දැමීමට කටයුතු කිරීම මෙන්ම මෙම තුවාල සිදුවූ ආකාරය පිළිබඳ සිදු කළ විමර්ශනයන්ගේ ප්‍රමාද වීමක් දක්නට ලැබේ. තවද ඉහත සඳහන් කරනු ලැබ ඇති මහාධිකරණ විනිසුරු එම්.එයි. සෙනෙවිරත්න මහතාගේ ප්‍රකාශයද මෙහිදී සලකා බැලිය යුතු වේ.

**නිගමනය** =:

ඒ අනුව ඉහත සඳහන් සියල්ල එක්ව ගත් කළ උක්ත වගඋත්තරකරුවන් විසින් පැමිණිලි පාර්ශවය සඳහන් කරන වින්දිතයන්ගේ අයිතිවාසිකම් කඩ කර ඇති අතර, එය 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) වගන්තිය උල්ලංඝනය කිරීමක් බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය** =:

01. වගඋත්තර පාර්ශවය විසින් අගතියට පත් පාර්ශවය වෙත රු. 10,000/-ක මුදලක් ගෙවීමට පියවර ගත යුතුය.

02. වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති, සහ සභාපති, පොලිස් කොමිෂන් සභාව වෙතද යොමුකරනු ලැබේ.

2021. 04 . 29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 07

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපත් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/R